# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2122/55 - 2019 මැයි මස 10 වැනි සිකුරාදා - 2019.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය : DIVPANN/LND/ACDEP/1/4/15.*

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/2017/Lo/283.*

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරං*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ,පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,මැදපත්තු බස්නාහිර කෝරළේ හොරතැපොල සහ වඩුමුන්නේගෙදර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2019.01.30 දිනැති අවසාන ගම් පිඹුර 292,පත්‍ර අංක 10,අතිරේක අංක 12 සහ අවසාන ගම් පිඹුර 293 පත්‍ර අංක 8,අතිරේක අංක 8,දරන පිඹුරු මගින් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8093 ක් වූ පහත විස්තර කෙරෙන බිම් කැබලි 03.

**01. කැබලි අංක 99**

ඉඩමේ නමඃ හොරතැපොලවත්ත; ඉඩමේ විස්තරයඃ ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිලි 02 ක කොටස්, සිමෙන්තියෙන් බඳින ලද ළිදක්, අවු 40-45 වයසැති පොල් ගස් 50 ක්, අවු 20-25 වයසැති පොල් ගස් 25 ක්, කජු ගස් 5 ක් කොස් ගස් 01 ක්, අවු 15-20 ක් වයසැති පුවක් ගස් 32 ක් සහිත මිශ්‍ර වගාවක් ඇත. හිමිකම් කියන්නාඃ කඩුවෙල කොරතොට උතුර අංක 716/5 හි පදිංචි ඒ.ඒ.අයි.ජයවර්ධන; ප්‍රමාණයඃ හෙක්ටයාර් 0.6498.

**02. කැබලි අංක 100**

ඉඩමේ නමඃ හොරතැපොලවත්ත; ඉඩමේ විස්තරයඃ ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ අවු 40-45 ක් වයසැති පොල් ගස් 02 ක් ඇත. හිමිකම් කියන්නාඃ සොයාගත නොහැක; ප්‍රමාණයඃ හෙක්ටයාර් 0.0173.

**03. කැබලි අංක 78**

ඉඩමේ නමඃ නිල්ලියමුල්ලවත්ත,කොන්ගහවත්ත; ඉඩමේ විස්තරයඃ ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, අවු 40-45 වයසැති පොල් ගස් 10 ක්, අවු 20-25 වයසැති පොල් ගස් 5 ක් ඇත; හිමිකම් කියන්නාඃ කඩුවෙල කොරතොට උතුර අංක 716/5 හි පදිංචි ඒ.ඒ.අයි.ජයවර්ධන; ප්‍රමාණයඃ හෙක්ටයාර් 0.1422.

1A - G 30047- 17 (2019/05)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ජුනි මස 19 වැනි දින පූ.භා. 10.00 ට පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019 ජුනි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

2019 මැයි මස 06 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පන්නල.

05-683

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.